பிரதிப் பிரதம செயலாளர் அலுவலகம் (நிருவாகம்) – கிழக்கு மாகாணம்
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (පරිපාලන) - නැගෙනහිර පළාත
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (ADMINISTRATION) - EASTERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| எனது இல. / මගේ අංකය. / My No. | EP/02/CMA/16 | உமது இல. / ඔබේ අංකය. / Your No. | | திகதி. / දිනය. / Date. | 2014.06.26 |

නැගෙනහිර පළාත් පරිපාලන චක්‍රලේඛ අංක : DCS(A)/04/2014

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන්

## පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක කිරීම

නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද නැගෙනහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ බඳවා ගැනීමේ පරිපාටිය 2013.04.02 සිට කට ක්‍රියාත්මක වේ.

02. අන්තර්ග්‍රහනය

බඳවා ගැනීමේ පරිපාටියේ 15 වන වගන්තියේ සඳහන් විධාවිධාන ප්‍රකාරව,

නියමිත දිනට පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III,II,I පන්ති වලට අයත් තනතුරුවල සේවය කරන නිලධාරීන් සියළුම දෙනා පහත සඳහන් පරිදි නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ අන්තර්ග්‍රහනය කරනු ලැබේ.

මෙම අන්තර්ග්‍රහනය හේතුවෙන් නිලධාරීන් දැනට ලබන වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

(අ) නියමිත දිනට පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ සිටින නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ III ශ්‍රේණියට,

(ආ) නියමිත දිනට පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ සිටින නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ II ශ්‍රේණියට,

(ඇ) නියමිත දිනට පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ සිටින නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ I ශ්‍රේණියට,

03. උසස්වීම

බඳවා ගැනීමේ පරිපාටියේ 12 වන වගන්තියේ දැක්වෙන උසස්වීම් පරිපාටිය ද 10 වන වගන්තියේ දැක්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග ද 2013.04.02 වන දින සිට වලංගු වේ. එසේ වුව ද ඔවුන්ට 17 වන වගන්තියේ දැක්වෙන අන්තර්කාලීන විධිවිධාන වලට හිමිකම් ඇත. (බඳවා ගැනීමේ පරිපාටිය පරිශිෂ්ඨ 01 හා 02 අනුව උසස්වීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කල යුතු වේ.

04. වෙනත්

බඳවා ගැනීමේ පරිපාටියේ 11 වන වගන්තිය යටතේ දැක්වෙන විධිවිධාන පරිදි සෑම නිලධාරියෙකුම භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු වේ. ඒ අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගන්නා ලද නිලධරයන් හට භාෂා ප්‍රවීනතාවය සමත්වීම් සම්බන්ධයෙන් 2014.01.21 දිනැත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හි විධිවිධාන අදාළ වේ.

කලාමදී පත්මරාජා,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන,
නැගෙනහිර පළාත.

கன்னியா வீதி, வரோதய நகர், திருகோணமலை.
කන්නියා පාර, වරෝදය නගර, ත්‍රිකුණාමලය.
Kanniya Road, Varothaya Nagar, Trincomalee.

Gen. Office I : 026 2224049
Gen. Office II : 026 2222114
Admin Officer : 026 3269885
Deputy Chief Secretaty : 026 2222703
Assistant Chief Secretaty I : 026 3269883
Assistant Chief Secretaty II : 026 2222593
Fax : 026 2227161
Web :www.ep.gov.lk
E-mail : admin@ep.gov.lk

6444